දෙහිවල, සුදර්ශන පාරේ. ශ්‍රී සුදර්ශන ධර්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය
මගින් ධර්ම දානය පිණිස සෑම පුර පසළොස්වක පොහෝ දිනයක්
පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.



# බෞද්ධෝදය

"ධම්මො හවේ රක්ඛති ධම්මචාරිං"

72 වර්ෂය - ශ්‍රී බු.ව 2561 | 2017 අගෝස්තු 07 | නිකිණි කලාපය

# නිවන් සුවය හැඳින ගනිමු.

ශාස්ත්‍රපති ඌරුගමුවේ අස්සජි හිමි

ආරෝග්‍ය පරමා ලාභා
සන්තුට්ඨී පරමං ධනං
විස්සාසා පරමා ඤාති
නිබ්බාන පරමං සුඛං

(ධම්මපදය- සුඛ වග්ගය)

අද දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික සදහම් පත්‍රිකාව සඳහා මාතෘකා කරගත් ඉහත දැක්වූ ගාථා ධර්මයේ සාමාන්‍ය සිංහලාර්ථය මෙසේය. ''නීරෝගී බව උසස්ම ලාභයයි. සතුට උසස්ම ධනයයි. විශ්වාසවන්තයා උසස්ම ඥාතිවරයායි. නිවන උසස්ම සැපතයි.''

ශරීරය ලෙඩ රෝග වලින් යුක්ත වූ විට නොලැබුණු දියුණුවක් ලබන්නටත්, ලැබුවා වූ දියුණුවෙන් ප්‍රයෝජන විඳීමටත් නොහැකි වේ. සිතෙහි සන්තෝෂයෙන් ක්‍රියා කිරීම ද කායික මානසික නීරෝගීතාව සඳහා බෙහෙවින් හේතු වෙයි. විශ්වාසවන්ත සත්පුරුෂ ආශ්‍රය ජීවිතයේ පරම අභිවෘද්ධිය සඳහා හේතු වේ. මේ අතර උසස්ම සුවය නිවන් සුවයම වනු ඇත. නිවන යන ශබ්ද මාත්‍රය පවා සැදැහැවතුන් ගේ කන් පිනවන, සිත සනසන මිහිරි හඬෙකි. කිසියම් කුසලයක් සිදුකොට සැවොම ප්‍රාර්ථනා කරනුයේ නිවන් සුවයයි. සැමගේ එකම පරමාර්ථයත් එම උතුම් නිවනයි.

තෘෂ්ණාව ''වාන'' යනුවෙන් හැඳින්වේ. ''නි'' යනු නික්මීම යන අර්ථයයි. මෙම වාන සංඛ්‍යාත තෘෂ්ණාවෙන් නික්මීම ''නිබ්බාන'' යනුවෙන් අර්ථ දැක්විය හැකිය. මෙය නිත්‍ය දෙයක් වන හෙයින් කිසි කලෙකත් අභාවයට පත් නොවේ. එසේම මෙම නිවන සඳහා බොහෝ සත්ත්වයින් පැමිණීමෙන් එහි පූර්ණත්වයක් හෝ නොපැමිණීමෙන් ඌණ තත්ත්වයක් හෝ ඇති නොවේ. මෙහි පැරණි අභිනව හීන යනාදී භේදයකුදු නැත. මෙම නිර්වාණය වනාහි හුදෙක් හටගැන්මක් හෝ සටහනක් නොමැති ලෝකෝත්තර ධර්මතාවයෙකි.

නිවන හුදු වේදයිත සුඛ ගණයට අයත් නොවේ. එනම් එහි කයින් හෝ මනසින් විඳිය හැකි සුවයක් නොමැතිවීමයි. වේදයිත සුඛ යනු මිනිස් බවට හෝ දෙව් බවට පත්ව පස්කම් සැපතින් ලබන සුවයයි. එම වේදයිත සුඛ මොහොතින් මොහොත විදුලියක් සේ වෙනස් වේ. එබැවින් එය අනිත්‍ය ය. දුකක්ම උපදවයි. වරෙක උදායි තෙරුණුවන් විසින් සැරියුත් තෙරණුවන් ගෙන් විමසන ලද ප්‍රශ්නයක් වූයේ ''විඳගන්නා සුවයක් නැත්නම් නිර්වාණයෙහි කවර සැපතක් පවතීද? යන්නයි. එයට සැරියුත් තෙරණුවන්ගේ පිළිතුර වූයේ ''යම් හෙයකින් මෙම නිවනෙහි විඳීමක් නැත්තේ ද එහි සුවය එයම වේය, යන්නයි.

නිර්වාණය සියළුම සංස්කාරයන් ගේ සන්සිඳීමෙන් ලැබිය යුතු වූ අවේදයිත සුවයකි. වේදයිත අවේදයිත සුඛ දෙකෙහි වෙනස කුෂ්ට රෝගී උපමාවක් මගින් පැහැදිලි කොට තිබේ. කුෂ්ට රෝගියා කැසීමෙන් හා ගින්නෙන් තැවීමෙන් මොහොතක සුවයක් ලබයි. ඒ සුවයට දැවීම් ආදිය ඇතිවීමෙන් පසුව දුකට පත්වේ. මෙවිට ඔහු රෝගය සුව වීමට අදාළ බෙහෙතක් භාවිතා කිරීමෙන් එය සුවකර ගතහොත් එයින්ම ශාන්ත සුවයක් විඳියි. මෙම කුෂ්ට රෝගියා මුලින් විඳි සුවය වේදයිත සුවයයි. පසුව ලැබූ සුවය සන්සිඳීමේ සුවයයි. සත්ත්වයා පස්කම් සුව විඳ තාවකාලික සුවයක් ලබයි. එහෙත් නිවන් සැප විඳ එවැනි තාවකාලික සුවයක් නොලබයි. එය හුදෙක් දුක් සන්සිඳීමේ සුවයක් වන හෙයිනි.

යථා තත්ත්වය තදාකාර වුව ද සාමාන්‍ය ලෝකයාට වැටහෙන්නේ වේදයිත සුවයම උසස් බවයි. ඒ අනෙකක් නිසා නොව එය ඔහුට අනාදිමත් කාලයෙක සිට පුරුදුව පුහුණුව ආ හෙයිනි. අවේදයිත සුවය විඳි බුදු, පසේ බුදු, මහරහත් යන ආර්ය උතුමන්ට පමණක් වේදයිත සුවයේ අසාරත්වය පෙනෙයි. නිර්වාණය පිහිටි

තැනක් නැත. ලෝකයෙහි ගිනි පවතී. ගින්න දැල්වීමට රැස් වී පවත්නා තැනක් නැත්තාක් මෙනි. ගිනි ගින්න දැල්වීමට අවශ්‍ය උපකරණ ඇති කල්හි ගිනි උපදවා ගත හැකිය. එසේම සීල, සමාධි, පඤ්ඤා ආදී ධර්මයන් ඇති කල්හි විද්‍යමාන වූ නිර්වාණය ප්‍රත්‍යක්ෂ වශයෙන් දැකිය හැකිය. එබැවින් තමතමන් ගේ නිර්වාණය පවත්නේ අන්‍ය දිශා දේශයක නොව තම තමා කෙරෙහි ම ය.

ඉහත දැක්වූ ආකාරයට නිර්වාණය පිහිටි ස්ථානයක් නොමැති හෙයින් එය ශුන්‍ය ධර්මයකැයි, වටහා නොගත යුතුය. ඇස් ඇත්තවුන් විසින් ඇසින් දකිනු ලබන සඳමඩල සේ මාර්ගඤාණලාභී ආර්යයන් විසින් මාර්ග ඤාණයෙන් නිර්වාණය ප්‍රත්‍යක්ෂ කළ යුතුය. උපතින් අන්ධ වූවෙකුට සඳමඩල දැකිය නොහැකිය. එහෙත් ඔහුට සඳමඩල නැතැයි කිව නොහැකිය. එසේම ප්‍රතිපත්ති විරහිත අන්ධ පෘථග්ජනයනට නිර්වාණය දැකිය නොහැකි වුව ද නිර්වාණය නැතැයි කිව නොහැකිය.

නිවන් දුටු උතුමෝ නන් අයුරින් එම නිවන වර්ණනා කළ නමුත් එහි ස්වරූපය නිරූපණය නොකළහ. ඉතා සියුම් ධර්මයක් බැවිනි. එය පෘථග්ජනයනට වැටහෙන සේ ප්‍රකාශ කිරීමට වචන නොමැත. මක්නිසාද? යත් ලෝක ව්‍යවහාරයෙහි ලෝකයා නොදත් ලෝකෝත්තර අර්ථයන් ප්‍රකාශ කිරීමට වචන ද නොමැති හෙයිනි. නිවන අතක්කාවචර හෙයින් තර්කානුසාරයෙන් ද දත නොහැකිය. ''ඒහි පස්සික'' (එව බලව) යයි කීමට යෝග්‍ය විද්‍යමාන ධර්මයක් හෙයින් තමාගේ නුවණැසින්ම දැකිය යුතුය. නිවන ඇති බව වටහාගත හැකි ක්‍රම සතරකි. එනම්,

01. ආගම සිද්ධිය
02. න්‍යාය සිද්ධිය
03. අනුමාන සිද්ධිය හා
04.ප්‍රත්‍යක්ෂ සිද්ධිය යි.

මෙහි ආගම සිද්ධිය යනු කුමක්ද? නිවන් දුටු බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලා විසින් නිවනක් ඇති බව නන් අයුරින් දක්වන ලදහ. උන්වහන්සේලාගේ එම වචන විශ්වාස කරන්නවුනට නිවනක් ඇතිබව ආගම වශයෙන් සිද්ධය. න්‍යාය සිද්ධිය නම් කුමක්ද? නිවනක් නැතිනම් නිවන් අරමුණු කොට පහළ වන මාර්ග සිත් ද ඇති විය නොහැකිය. මාර්ගඵල සිත් නැතිනම් මාර්ගඵල ලාභීහු ද නොවෙති.

නමුත් මාර්ගඵලාභීන් සිටි බවට ඉතිහාසය සාක්ෂි දරයි. මෙසේ න්‍යායාත්මකව නිවනක් ඇති බව පැහැදිලිය. අනුමාන සිද්ධිය නම් ඇසට පෙනෙන දෙයට සමාන කොට ඇසට නොපෙනෙන දෙය බැලීමය. නිවසක දොර තුළින් පෙනෙන ගවයෙකු ගේ අඩක් දැක එහි සම්පූර්ණ ගවයෙක්ම සිටිත් යැයි තීරණයකට බැස ගන්නාක් මෙනි. ප්‍රත්‍යක්ෂ සිද්ධිය නම් නිවන් දුටු බුදු, පසේ බුදු, මහරහත් යන ආර්ය උතුමන්ට එය ප්‍රත්‍යක්ෂ වශයෙන්ම අවබෝධ වීමයි. මෙයින් ආගම න්‍යාය හා අනුමාන යන සිද්ධි තුනෙන්ම නිර්වාණය ඇති බව අපට සාමාන්‍යයෙන් වටහාගත හැකිය. නිර්වාණය ස්වභාවයෙන් එකක්ම වුව ද එය අවබෝධ කරගන්නා පිළිවෙත අනුව සෝපාදිසේස හා අනුපාදිසේස යැයි දෙවැදෑරුම් ස්වභාවයකින් ද යුක්ත වෙයි. පංච උපාදානස්ඛන්ධය පමණක් තිබිය දී කෙලෙසුන් නසා නිර්වාණාවබෝධය ලැබීම සෝපාදිසේස නිබ්බානය යි. එනම් මාර්ගඵල ලබා ජීවත්වීම ලෙස සරලව කිව හැකිය. ස්කන්ධ පරිනිර්වාණයෙන් පිරිනිවීම පිළිබඳ නිර්වාණය අනුපාදිසේස නිබ්බානය යි. එනම් නිර්වාණාවබෝධයත් පරිනිර්වාණයත් එකවිට සිදුවීමයි.

මෙවන් කෙටි හැඳින්වීමකින් නිර්වාණය පිළිබඳ මද විස්තරයකුදු ඉදිරිපත් කළ නොහැකිය. එහෙත් මෙම කරුණු ස්වල්පය හෝ මනා විචාරශීලී මනසකින් විමසා බලන්නෙකුට නිර්වාණය යනු කුමක්ද? යන්න පිළිබඳ යම් වැටහීමක් ලබාගැන්ම අපහසු නොවනු ඇත.

## විශේෂ නිවේදනය

අපේ නීරෝගීකම මැයෙන් ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයක් සංගමය එළි දක්වා ඇත. මළගිය අයෙකුට පිං පැමිණ වීමට, වෙනත් ආසිරි පැතීමට, පූණ්‍ය අවස්ථාවන් හි බෙදා දීමට මුද්‍රණ වියදම පමණක් ගෙවා මෙම පොත සංගමයෙන් ලබා ගත හැක. පහත සඳහන් ලිපිනයට දන්වා හෝ දුරකථන අංක **0112 728779, 077 9470616** අංකයෙන් වැඩි විස්තර ලබා ගත හැක. ගරු ලේකම්, දෙහිවල බෞද්ධෝදය සංගමය, දම්සක් සෙත් සෙවන, අංක **26** සී, සුබෝධාරාම පාර, දෙහිවල